**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 ජූනි මස 07 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** මාධ්‍යවේදී M.F.M ෆසීර් මහතා විසින් ලබාදුන් තොරතුරු මත නීතිඥ මනුෂිකා කුරේ වන මම විසින් මෙම වාර්තාව සකස් කරන ලදී.

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා, විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක<br>නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් වසන්ත පෙරේරා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1,2,4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>3,5 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී. | |

| | | |
|---|---|---|
| | 6 වන චූදිත වෙනුවෙන් ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

Voir dire පරීක්ෂණය මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆුර් මාමා හෙවත් ගෆුර් නානා හෙවත් අබු හදීද් ලබා දෙන ලද පාපොච්චාරණය සම්බන්ධයෙන් මෙදිනද පවත්වා ඇත.

එහිදී, හිජාස් හිස්බුල්ල නම් තැනැත්තාට විරුද්ධව සාක්ෂි ලබා දෙන ලෙස බලකරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී (CID) තමාට පහර දුන් බවට තුන්වන චූදිත වන ගෆුර් මාමා සඳහන් කර ඇත. එක් දිනක් CIDහී මාධව ගුණවර්ධන නැමති නිලධාරියා තුන්වන චූදිතව සහකාර පොලිස් අධිකාරී (Assistant Superintendent of Police) (ASP) වෙත ගෙන ගිය බවටත්, එහිදී ඔහු හිජාස් හිස්බුල්ලා නැමැත්තාව දන්නවාද යන්න ASP විසින් ඔහුගෙන් විමසූ බවත්, එහිදී හිජාස් නැමැත්තාව හඳුනන බව තුන්වන චූදිත පැවසූ බවත්, එලෙස හඳුනන්නේ කෙසේද යන්න විමසූ කළ, එහා පැත්තේ සිර කුටියේ හිජාස් නැමැත්තා සිටින බැවින් ඒ හරහා ඔහුව හඳුනන බව පැවසූ බවටත්, CID වෙත පැමිණීමට පෙර හිජාස් නැමැත්තාව හඳුනන්නේද යන්න විමසූ බවත්, එලෙස CID වෙත පැමිණීමට පෙර හිජාස් නැමැත්තාව නොදන්නා බව තමන් පැවසූ බවත් 3 වන චූදිත සඳහන් කර ඇත. හිජාස් නැමැත්තාව දන්නේද යන්න විමසා දිගින් දිගටම තමන්ට පහර දුන් බවටත්, එහිදී හිජාස් නැමැත්තාව පෙරදී තමන් නොදන්නේය යන ස්ථාවරයේම තමන් සිටි බවටත් 3වන චූදිත සඳහන් කර ඇත.

ASPගේ කාමරය වෙත තුන්වන චූදිත යන විටත් එහි පරිගණකයේ යමක් සටහන් (type) කර තිබූ බවත්, චූදිත ඉදිරියේදීම එහි යම් යම් දෑ වෙනස් කළ බවටත්, එය චූදිතට අයත් ලේඛනයක් යන්න චූදිත දැනුවත්ව ඇත්තේ එහි චූදිතගේ ජාතික හැඳුනුම්පත් අංකය තිබෙනු දැකීම නිසාවෙන් බවත් තුන්වන චූදිත සඳහන් කර ඇත. එමෙන්ම හිජාස් නැමැත්තා පිළිබඳ කට උත්තරයක් දෙන ලෙස බලකර පහර දුන් බවටත් තුන්වන චූදිත සඳහන් කර ඇත.

පාපොච්චාරණයට අත්සන් කිරීමට නොහැකි බවට තුන්වන චූදිත දැනුම් දුන් විට, සයින්දමරුදූ පිපිරීමේදී මියගිය තුන්වන චූදිතගේ දියණියකගේ ඇඳුම් රහිත මළසිරුරෙහි ඡායාරූපයක් පෙන්වා ඇති අතර, එය දැකීම දරාගත නොහැකිව තුන්වන චූදිත දෑතින් ඇස් වසාගත් බවටත්, එම අවස්ථාවේදී ASP සහ මාධව ගුණවර්ධන නැමති නිලධාරියා තුන්වන චූදිතගේ දෑත්, ඇස් වලින් ඉවත් කළ බවත්, එම අවස්ථාවේදී චූදිත නැවතත් දෑත් නොමැතිව දැස් වසා ගත් බවටත්, එය දරා ගැනීමට නොහැකිව අත්සන් කළ බවටත් චූදිත සඳහන් කර ඇත. එමෙන්ම ASP විසින් මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස ලබා දුන් සාක්ෂියේ සඳහන් පරිදි කිසිදු දෙයක් සිදු නොවූ බවටත්, එම සාක්ෂියේදී පරිවර්තකයකු සිටි බව සඳහන් කළ නමුත් පරිවර්තකයකු නොසිටි බවටත්, දින කිහිපයක් ප්‍රකාශය ලබා නොගත් බවටත්, මෙම පාපොච්චාරණය ගැනීම හා සබැඳි සිදු වීම දිනක් තුළදී සිදු වූ බවටත් තුන්වන චූදිත සඳහන් කර ඇත.

පුත්තලම ප්‍රදේශයේ ස්ථාන කිහිපයක ඡායාරූප පෙන්වා CIDහිදී ප්‍රශ්න කළ බවත් තුන්වන චූදිත සඳහන් කර ඇත.

3. **Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

4. **Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 සැප්තැම්බර් මස 04,05,18,19 වන දිනයන්

5. **Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**